දිවයින
ඉරිදා සංග්‍රහය
Online EDITION



විශේෂාංග

# මේ ගමන දුෂ්කරයි එත් ජයග්‍රහණය ස්ථිරයි

ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ



රජයේ ජනප්‍රියතාව තීරණය වී ඇත්තේ ත්‍රස්තවාදයට එරෙහිව දියත් කර ඇති මෙහෙයුම්වලින් බව මේ වන විට තහවුරු වී ඇති මතයකි.

ආරක්ෂක හමුදාවන් ත්‍රස්තවාදයේ හදවත බඳු කිලිනොච්චිය මුදා ගැනීමේ අවසාන මෙහෙයුමට සූදානම් සිටී. ත්‍රස්තවාදීන්ද සිය වසර 30 ක අත්දැකීම් ඔස්සේ තමන්ගේ අවසාන මොහොත කල්දමා ගැනීම සඳහා හැකි සෑම පියවරක්ම අනුගමනය කිරීමට සූදානම්ව සිටී.

මේ මොහොතේ යුද මෙහෙයුම්වල තත්ත්වය සහ එහි අනාගතය පිළිබඳව ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා සමග දිවයින ඉරිදා සංග්‍රහය කළ සාකච්ඡාවකි මේ.

ප්‍රශ්නය ඃ වන්නි මෙහෙයුමේ නිතර 57 වැනි සේනාංකය වවුනියාවේ තම්පනේ ප්‍රදේශයෙනුත්, 58 වන සේනාංකය මන්නාරමෙනුත් මෙහෙයුම් ආරම්භ කොට මේ වන විට වසරකුත් මාස කිහිපයක් ගතවී තිබෙනවා. වසරක පමණ කාලයක් ඕමන්ත සහ මන්නාරම යන ප්‍රදේශ යා කරන ඉදිරි ආරක්ෂක වළල්ලේ මෙහෙයුම් වල නිරත වූ මෙම සේනාංක දෙක ඉතා කෙටි කාලයක් තුළ එම ආරක්ෂක වළලු පසුකර විශාල දුරක් ඉදිරියට ගමන් කර මේ මොහොත වන විට 58 වැනි සේනාංකය නච්චිකුඩා ප්‍රදේශයේත් 57 වන සේනාංකය මල්ලාවි ප්‍රදේශයේත් මෙහෙයුම්වල නිරතවී සිටිනවා. ඒ වගේම වාර්තා වන ආකාරයට කොටි සංවිධානයත් ප්‍රබල ප්‍රතිවිරෝධයක් දක්වමින් සිටිනවා.

57 සහ 58 යන සේනාංකවල මීළඟ ඉලක්ක වන්නේ පූනරීන්, මාන්කුලම් සහ කිලිනොච්චිය යන ප්‍රදේශ බව ඉතා පැහැදිලිය. ඉදිරි මෙහෙයුම් කෙබඳු ස්වරූපයක් ගනීවි ද?

පිළිතුර ඃ නිවැරැදි ලෙස ක්‍රියාන්විතයක් සිදු කරනවා නම් ඒ සඳහා හමුදාපතිවරුන්ගෙන් හමුදාමය විශ්ලේෂණයක් ලබාගත යුතු වෙනවා. ඒක

ජනාධිපතිතුමා විසින් සිදු කළා. ඒක අරගත්තාට පසුව තමයි හමුදාපතිවරුන්ටත් කියන්න පුළුවන් වන්නේ හමුදා මෙහෙයුමක් කොයි කාලේද, මොන විදිහටද වෙන්නේ කියලා. අපි නැගෙනහිර පළාත දිනුවාට පස්සේ යුද හමුදාපතිතුමා එවැනි විශ්ලේෂණයක් කරලා ජනාධිපතිතුමාට කිව්වා, මේ වගේ කාලවකවානුවකදී අපිට කිලිනොච්චියට ළඟාවෙන්න පුළුවන් කියලා. හමුදාපතිතුමා කිව්වේ දෙසැම්බර් වෙනකොට කිලිනොච්චියට යන්න පුළුවන් කියලා. මේක තමයි සැලැස්ම වුණේ. අඩම්පන්, මඩු වගේ පැතිවල අපේ හමුදාවන් හුඟක් කාලයක් ගෙව්වා. ඇත්තටම සමහර අයට චකිතයක් ඇති වුණා ඇයි හිරවෙලාද කියලා. නමුත් ඒ අවස්ථාවේදී යුද හමුදාපතිතුමාගේ අදහස තිබුණේ භූමිය අල්ල ගන්නවට වඩා අපි එල්.ටී.ටී.ඊ.යට අයත් සම්පත් විනාශ කරලා, සටන් බළකා විනාශ කරලා, ඒ ගොල්ලන්ගේ බලය බිඳින්න. මුලින් පටන් ගන්න කොට වුණත්, එල්.ටී.ටී.ඊ. එක වුණත් ඒ අයගේ සම්පත් වැඩිපුර යොදවලයි තිබුණේ. ඒක තමයි හොඳම අවස්ථාව වැඩිපුර හානි සිදුකරන්න. මේක බොහොම පුළුල් යුද පෙරමුණක් නිසා අපිට තැනින් තැන ඉදිරියට යන්න තිබුණා. නමුත් එහෙම ගියොත් වෙන්නේ ඒ ගොල්ලන්ගේ බළකායන්, සම්පත් ඉතුරු වෙනවා. එතැනදී කවුරුත් දන්නවා එල්.ටී.ටී.ඊ.යට වුණු හානිය. අපිට පසුගිය කාලයේ මුදාගත් ප්‍රදේශවලින් හමුවුණු සොහොන් භූමි, පෝස්ටර්ස් එහෙම බැලුවම පැහැදිලි වනවා අපි කලින් තාක්ෂණික මාර්ගවලින් දැන ගත් තොරතුරු නිවැරැදි බව. ඉස්සෙල්ලා ඔය සමහර යුද විශ්ලේෂකයෝ සැක කළා අපි කියන සංඛ්‍යා ලේඛන හරිද කියලා. නමුත් දැන් අපි ඉදිරියට යන විට දකින්නට තිබෙන දේවල් අනුව මේ සංඛ්‍යා ලේඛන නිවැරැදි බව ඔප්පු වෙනවා. මේ දක්නට ලැබෙන සොහොන්වල එල්.ටී.ටී.ඊ.යේ සාමාන්‍ය අයගේ සිරුරුවල සොහොන් නැහැ. සෑහෙන දුරට එගොල්ලන්ගේ සම්පත් අපි විනාශ කළා. මේක අපි කරන්නේ පාබල හමුදාවෙන් පමණක් නොවේ. අපි කාලතුවක්කු ප්‍රහාරවලින් හා ගුවන් ප්‍රහාරවලින් සෑහෙන දුරට අපි එගොල්ලන්ගේ සම්පත් විනාශ කළා. ඒ අතර නාවික හමුදාව විසින් තවත් එල්.ටී.ටී.ඊ.ය සතු විශාල සම්පත් ප්‍රමාණයක් විනාශ කළා. එගොල්ලන්ගේ නැව්, සාගරයෙන් ආයුධ සැපයෙන මාර්ග විශාල වශයෙන් අපි නැතිකර දැම්මා. තව පොඩි පොඩි මාර්ග තිබෙන බව අපි දන්නවා. මෙහෙම විනාශ කළ විට ඒක දරා ගන්න බැරි වුණා. අපි සෑහෙන්න ඉදිරියට එන්න පටන් ගත්තා. මෙහෙම එනකොට පුනරීන් පාර දිගේ විශේෂ බළකාය නච්චිකුඩා දක්වා ඉදිරියට ගියා. මෙහෙම ගොස් අපි අද අපේ සැලැස්ම අනුව සතුරා විනාශ කරමින්, ඔවුන්ගේ සම්පත් විනාශ කරමින්, ඔවුන්ගේ මුහුදු සැපයුම් මාර්ග අවුරමින් ඉදිරියට ඇවිත් තිබෙනවා.

අපගේ සැලසුම්වල කාලයටත් වඩා මදක් ඉක්මනින් අපි ක්‍රියාත්මකවී තිබෙනවා. ඒ සැලසුම අනුව අපි ඉදිරියට යනවා.

ප්‍රශ්නය : ජාතික හා ජාත්‍යන්තර සමහර සංවිධාන, පුද්ගලයන් පුන පුනා ප්‍රකාශ කළේ එල්.ටී.ටී.ඊ.ය පරාද කරන්න පුළුවන් සංවිධානයක් නොවන බවයි. ඉන්දියානු හමුදාවටවත් පරාද කරන්න බැරි වූ එල්.ටී.ටී.ඊ.ය ලංකා හමුදාව පරාද කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය ඒ පුද්ගලයන් ඇසුවා. වසර තිහක කාලයත් තිබූ මේ මිථ්‍යාවන් අද හමුදාව විසින් විනාශ කර තිබෙනවා. මෙතැනට හමුදාව මෙහෙයවීම සිදුවුණේ කොහොමද?

පිළිතුර : වඩා වැදගත් වන්නේ ආයුධය නොවෙයි, ආයුධය පිටුපස ඉන්න පුද්ගලයා. ඔහුගේ මානසිකත්වය. ඔහුගේ සූදානම. ඇත්ත වශයෙන්ම ආයුධය පිටුපස්සේ ඉන්න රණවිරුවා තමයි වැදගත් වෙන්නේ. මුලින්ම ඔහුගේ සිත, මනස, ඔහුගේ පුහුණු තත්ත්වයත් මෙහිදී බලපානවා. මේ අනුව ඔහුගේ කැපවීම තිබෙනවා නම් යුද්ධයක් ජය ගැනීමේ මූලික අඩිතාලම සම්පූර්ණ වෙනවා. අපි මේ කර්තව්‍ය මුලින්ම ඉෂ්ට කළා.

ප්‍රශ්නය : එල්.ටී.ටී.ඊ.ය විමුක්ති හමුදාවක්. ලංකා හමුදාව කුලී හමුදාවක් ආදී ලෙසින් හමුදාවේ කැප කිරීම රට වෙනුවෙන් නොව සේවයක් ලෙසත් සමහරුන් මේ කාලයේදී තක්සේරු කළා.

පිළිතුර : අපේ අය කුලියටයි, එල්.ටී.ටී.ඊ.ය කැපවීමයි කියන්න හේතුවක් නැහැ. අපේ හමුදා සටන් කරන්නේ අපේ මාතෘභූමිය වෙනුවෙන්. ඕනෑම සමාජයක වැඩිදෙනෙක්, මාතෘ භූමිය කෙරෙහි ඇල්මක් තිබෙනවා. ටික දෙනෙක් තමයි, මේකෙන් පිටතට ගිහිල්ලා, සල්ලි හා නොයෙක් නොයෙක් දේවල් වෙනුවෙන් තමන්ගේ ජීවිතය යොමු කරවන්නේ. නමුත් වැඩි දෙනෙක් මාතෘභූමිය කිව්වම ඉබේම කැප කරන්න සූදානම්. සෑම විටම අපේ නායකත්වයට හැකියාවක් තිබිය යුතුයි මේ දේ උලුප්පලා ගන්න.

මම හමුදාවේ ඉන්න කාලේ, අපි සටන් කළේ ඒ කාලේ හිටපු නායකයන් අපේ මානසිකත්වය හොඳට හැදුවා. ජෙනරල් විමලරත්න වගේ අය දිනපතා අපට කතා කරනවා. මේකේ අවශ්‍යතාව කියලා දෙනවා. සෙබළුන්ට කතා කරනවා. ඉතිහාසය කියල දෙනවා. හුඟක් වෙලාවට සෙබළෙක් මේවා දන්නෙ නැහැ. ඒ අයට ඒ

දැනුම ලබා දුන්නාම එහි අවශ්‍යතාව තේරුම් යනවා. එවිට තමන්ගේ කාර්ය සඳහා අවශ්‍ය කැපවීම ලැබෙනවා. අපේ සෙබළු මේ කැපවීම කරන්නේ ජීවිතය පරදුවට තබලා. සල්ලිවලින් මනින්න බැහැ රණවිරුවෝ කරන සේවය. තමන්ගේ පවුල් අමතක කරලා කරන ඒ කැප කිරීම මුදලකින් තක්සේරු කරන්න බැහැ.

ප්‍රශ්නය : යුද්ධයෙන් ත්‍රස්තවාදය නිමා කළත් මේ තත්ත්වය මුළුමණින්ම නිම කරන්න

තව කාලයක් යන බව හමුදා සෙන්පතිවරු ප්‍රකාශ කර තිබුණා. සමහරු මෙයට විවිධ අර්ථකථන ලබාදී තිබුණා. මේ ගැන ඔබගේ පැහැදිලි කිරීම කුමක්ද?

පිළිතුර ඃ නැඟෙනහිර මුදා ගත්තට පස්සේ අපි හමුදා ආණ්ඩුවක් දැම්මේ නැහැනේ. අපි ඡන්දය තියලා ඒ කටයුතු ජනතාව වෙත බාරදීලා තියෙනවා. මෙහෙම කළත් ඒ ත්‍රස්තවාදීන් සියලු දෙනෙක්ම මේක එක දවසින් අතහරින්නේ නැහැනේ. ක්ලේමෝ එකක් තියන්න සංවිධානය වෙන්න, ඒගොල්ලෝ බලයි. අපේ අතට පාලනය ගත්තත් ඒ ගොල්ලෝ සැඟවී කටයුතු කරයි. ආයුධ හංගලා තියයි. ඒවා ඉදලා හිටලා ගනියි. එක පාලනය කරන්න කාලයක් ගත වෙනවා. මේ නිසා ටික කලක් යනකං ආරක්ෂක අංශ විමසිලිමත් කළ යුතු වෙනවා. එහෙම නොකළොත් දේශපාලනික වශයෙන් පත්වන අයටත් වැඩ කරන්න අමාරුයි. තුවක්කු ගෙනල්ලා වෙඩි තියන එක සැඟවී සිටින ත්‍රස්තවාදියකුට පහසු දෙයක්. හමුදාමය ජයග්‍රහණ අත්පත් කරගත්තාට පසු දේශපාලන ක්‍රමය ස්ථාපිත වූ පසුත් හමුදාව සෝදිසියෙන් සිටිය යුතුයි. එකනේ රටක හමුදාවක් තියෙන්නේ. එහෙම නැත්නම් රටවල්වල හමුදාවන් නැතිකරලා දායිනේ. ඕනෑම මොහොතක කලහකාරී පුද්ගලයන් සමාජයක ඇතිවෙන්න පුළුවන්. හමුදාව තියෙන්නේ දේශපාලන රාමුව ආරක්ෂා කිරීම සඳහායි.

ප්‍රශ්නය ඃ ජවිපෙ නායකයකු මෑතකදී ප්‍රකාශ කර තිබුණා, කොටි ත්‍රස්තවාදීන් යුද්ධයෙන් පරාද කරන ලෙස මුලින්ම කියා සිටියේ ඔවුන් බව. ඒ මොහොතේ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඒ සඳහා වන සූදානමක නොසිටි බව. මුලදී අකමැති පසුව ජවිපෙ බලපෑම මතද ආණ්ඩුව මෙම ක්‍රියාන්විත සඳහා ප්‍රවිශ්ට වුණේ.

පිළිතුර ඃ එකෙන් වැරැදි අවබෝධයක් ජනතාව අතර දෙන්න හදනවා. මේවගේ තීරණය අරගෙන ත්‍රස්තවාදය පරාද කළ යුතුයි කියන එක ජනාධිපතිතුමා කිව්වේ එම තනතුරට පත්වීමටත් පෙර තමන්ගේ මහින්ද චින්තනය ප්‍රතිපත්ති ප්‍රකාශනයෙයි. ගෞරවනීය සාමයක් උදාකරන්නයි කියලා එතුමා කිව්වේ. ගෞරවනීය කියන වචනය පාවිච්චි කළේ ත්‍රස්තවාදය පරාද කරනවා කියන අර්ථය ඇතිව. නමුත් මේක කිරීමට එක පාරට බැහැ. 2005 ජනාධිපතිතුමා රට බාර ගන්න අවස්ථාවේදී හමුදාවට තිබුණු තත්ත්වය අපි දන්නවා. නිසි පුද්ගලයන් ඒ හමුදාපතිවරුන් කළා. ඊට පසු බිඳුණු ආරක්ෂක වළලු නිවැරැදි ලෙස සකස් කළා. හමුදාවට අවශ්‍ය අවි ආයුධ ගේන්න කාලයක් අවශ්‍ය වුණා. මේ සියල්ල සඳහා යුද විශ්ලේෂණයක් කළ යුතුයි. ඊට කාලයක් ගත වෙනවා. එහෙම නැතුව ජනාධිපතිතුමා පත්වෙච්ච ගමන්ම යුද්ධ කරන්න බැහැ. මුල් කාලයේදී ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මෙම යුද මෙහෙයුම්වලට එරෙහිව විශාල බලපෑම් ආවා. යුද්ධ කරන්න එපා, සාකච්ඡා කරන්න කියලා. ජනාධිපතිතුමා, කොච්චර අමාරුවෙන්ද මේ ආයුධ එහෙම රටවල්වලින් ගේන්න ගත්තේ කියලා මම දන්නවා. සමහර රාජ්‍ය නායකයන් එතුමාට පුද්ගලිකව

කතා කළා. ඒ ඒ රටවලටත් අභ්‍යන්තර බාහිර බලපෑම් තිබුණා. ඒවා මග හරිමින් තමයි ජනාධිපතිතුමා කටයුතු කළේ. ඉතිහාසයේ කවදාවත් නොකරපු ලෙස එකවරම හමුදාව සියයට 40 කින් වැඩි කළා. පනස්දාහක් හමුදාව වැඩි කළා. එක වසර දෙකකට පෙර සිදු කළා. ආර්ථික අර්බුදයක් තිබ්බ මොහොතකයි මේ සියලු දේ කළේ. ජනතාව අතරින් 50000 ක් බඳවා ගන්න එක කොච්චර අමාරුද? ඒ සියලු දේ කළා. මේවා එක දවසින් කරන්න පුළුවන් දේවල් නොවෙයි. කවුරු හරි කියනවා නම්, අපි තමයි ගහන්න කිව්වේ කියලා, එක ජනතාව නොමග යවන්න කරපු කතාවක්. ජනාධිපතිතුමා දුන්න නායකත්වය නිසා තමයි මේ මූලික සංවිධාන ඇති කරමින් අපි මෙතැනට ළඟාවී තිබෙන්නේ.

ප්‍රශ්නය ඃ හමුදාව දැන් ළඟාවී තිබෙන්නේ වැඩිපුර සාමාන්‍ය ජනතාව ගැවසෙන ප්‍රදේශයන්ට. කිලිනොච්චිය කියන්නේ එල්.ටී.ටී.ඊ. මූලස්ථාන ප්‍රදේශයක් වගේම සාමාන්‍ය ජනතාව වැඩිපුර සිටින ප්‍රදේශයක්.

මේ නිසා සිවිල් වැසියන්ට වැඩි හානි වෙන්න පුළුවන්. ඒ නිසා ජාත්‍යන්තර මැදිහත්වීමකින් සිවිල් වැසියන්ට සිදුකරන හානි අවම කරන්න කටයුතු යෙදිය යුතුයි යනාදී ලෙස සමහර අංශවලින් ඉල්ලීම් ඉදිරිපත්වී තිබෙනවා. මේ ගැන ඔබගේ අදහස කුමක්ද?

පිළිතුර ඃ එක වැරැදි අදහසක්. ඔය තත්ත්වයම යාපනය මුදා ගැනීමේදී තිබුණා. ඔයිට වඩා ජනතාවක් එතැන හිටියා. ලක්ෂ හතරක ජනතාවක් අවතැන් වුණා. නමුත් වන්නියේ සිටින්නේ එයින් භාගයකටත් වඩා අඩු ප්‍රමාණයක්. අපිට මේක අලුත් දෙයක් නෙමෙයි. නැගෙනහිරදී අපි මේ තත්ත්වයට සාර්ථකව මුහුණ දුන්නා. අවතැන්වූ ජනයා යළි වසරකට අඩු කාලයකදී පදිංචි කළා. ඒ දේම අපිට වන්නියේදී කරන්න පුළුවන්. යුද්ධය පවතින විට ඒ ජනතාවට අවශ්‍ය නවාතැන්, ආහාර අපට ලබා දෙන්න පුළුවන්.

ප්‍රශ්නය ඃ මෙම ජනතාවගේ මූලික අවශ්‍යතා දඩමීමා කරගනිමින් ජාත්‍යන්තර මැදිහත්වීමක් සමහරුන් ඉල්ලා සිටිනවා.

පිළිතුර ඃ මෙතැනදී තමයි අපේ මාධ්‍ය වුණත් හරි දේ පැහැදිලි කරදිය යුත්තේ. ඒ අවතැන්වීම පමණක් උලුප්පන්නේ නැතිව අපිට තිබෙන හැකියාව මීට පෙර අපි කරලා තිබෙන දේවල් ගැන පෙන්වාදිය යුතුයි. මේ කරන්නේ එල්.ටී.ටී.ඊ.යේ වුවමනාව ඉටු කිරීමයි. අපි මුහමාලේ වැහැව්වාම කිව්වා ජනතාව බඩගින්නේ මැරෙයි කියලා. එක අරින්න, අරින්න කිව්වා. අපි දන්නවා එක අරින්න අවශ්‍ය එල්.ටී.ටී.ඊ.යට යාපනයට යන සෙනගයි, බෝම්බ, ආයුධ ගෙනල්ලා යාපනය

අස්ථාවර කරන්න වුවමනාවක් තිබුණා. අපි එකට ඉඩදුන්නේ නැහැ. අපි එතැන ඇරියේ නැහැ. එතැනදී හැම දෙනෙක්ම, එක මානුෂික ප්‍රශ්නයක් කියලා පෙන්න පෙන්න ඒ දොර ඇරගන්න හැදුවා. නමුත් අපි ඒ තීරණය ගත්තා. නමුත් ජනතාවට විය යුතු සේවය අපි සැලසුවා. මෙතැනදීත් වෙන්න ඕනේ එකයි.

ප්‍රශ්නය ඃ ඔබ මීට සති කිහිපයකට ප්‍රථම ගුවන් හමුදාපතිවරයාත් සමග ත්‍රිකුණාමලය ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකාවක නිරත වුවා. එම නිරීක්ෂණ චාරිකාව නිමවී සති දෙකක් ගෙවී යෑමටත් ප්‍රථම කොටි සංවිධානය ඔවුන් සතු සැහැල්ලු ගුවන් යානා යොදාගෙන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ හමුදා කඳවුරු සංකීර්ණයකට බෝම්බ හෙළුවා.

ගුවන් ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කොට ඇති බව ගුවන් හමුදාපති සහ රජය ප්‍රකාශ කළත් කොටි සංවිධානය යළිත් බෝම්බ ප්‍රහාරයක් එල්ල කර නිරුපද්‍රිතව පලාගොස් තිබෙනවා. මෙම තත්ත්වය ඔබ දකින්නේ කෙසේද?

පිළිතුර ඃ කොටි සංවිධානය සැහැල්ලු ගුවන් යානා යොදාගෙන එල්ල කළ එම ගුවන් ප්‍රහාරයේ කිසිදු හමුදාමය බලපෑමක් හෝ වටිනාකමක් නැහැ. කොටි සංවිධානය දිගින් දිගටම ලබන පරාජයන් හමුවේ ඔවුන්ට සහයෝගය දක්වන ප්‍රජාව සතුටු කිරීම සඳහා තමන් තවදුරටත් ශක්තිමත්ව සිටින බව පෙන්වීම සඳහා මෙම ප්‍රහාරය එල්ල කළ බව පැහැදිලියි.

කොටි සංවිධානය මේ වන විට ගුවනින් පැමිණ 6 වතාවක් පමණ බෝම්බ හෙළා තිබෙනවා. එම කාලය තුළ අපගේ ගුවන් හමුදාව 6000 වතාවක් පමණ බෝම්බ හෙළා තිබෙනවා. කොටි සංවිධානය ගුවනින් හෙළන බෝම්බයක බර කි.ග්‍රෑ. 30 ක් පමණ වෙනවා. එක් ගුවන් යානයකින් ඔවුන්ට රැගෙන ආ හැක්කේ බෝම්බ දෙකක පමණ ප්‍රමාණයක් පමණයි. නමුත් අප ගුවනින් කි.ග්‍රෑ. 250 සිට කි.ග්‍රෑ. 1000 දක්වා බරකින් යුතු බෝම්බ හෙළනවා. ඒ අනුව බැලුවහම කොටින්ගේ ගුවන් ප්‍රහාර ඉතා සුළු ප්‍රමාණයේ ඒවා බව පැහැදිලි වනවා.

අප ගුවන් ප්‍රහාර එල්ල කරන්නේ නිශ්චිත ඉලක්කයකට. නමුත් කොටි සංවිධානය පසුගියදා එල්ල කළ ගුවන් ප්‍රහාරය කිසිදු එල්ලයක් ගැනීමකින් තොරව එල්ල කර තිබෙනවා. කොටි සංවිධානය එලෙස කිසිදු එල්ලයකින් තොරව බෝම්බ දමා යෑමට සිදුවී තිබෙන්නේ අපගේ ගුවන් හමුදාව නිරන්තර සූදානමින් සිටින නිසයි.

එහෙත් කොටින්ගේ මෙම සැහැල්ලු ගුවන් යානා බිම හෙළිය නොහැක්කේ ඇයිද කියන ප්‍රශ්නය බොහෝදෙනකු තුළ තිබෙන බව මම දන්නවා. අපගේ ගුවන් ආරක්ෂණ පද්ධතිය නිසා කොටි ගුවන් යානා මුලතිව් ප්‍රදේශයේ සිට ඉතා ආසන්න ප්‍රදේශ දක්වා

ඉලක්ක සඳහා පමණයි මෑතකදී පැමිණියේ. කොටි ගුවන් යානා ඉතා කෙටි කාලයක් ගුවනේ තිබීමත්, ඉතා පහළින් පියාසර කර නිසි ඉලක්කයක් ගැනීමට කිසිදු උත්සාහයක් නොදරා පලා යෑමත් නිසා ඔවුන්ට පලා යෑමට හැකිවී තිබෙනවා. නමුත් තවදුරටත් ඒ ආකාරයට හෝ ගුවනින් බෝම්බ හෙළීමට කොටින්ට ඇති හැකියාව නැති කිරීමට අවශ්‍ය පියවර අප ගෙන තිබෙනවා.

සාකච්ඡා කළේ මනෝජ් අබයදීර
එරික් ගාමිණී ජිනප්‍රිය

Powered By - weblink

සීමාසහිත උපාලි පුවත්පත් සමාගම
අංක 223 , බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13, ශ්‍රී ලංකාව